අතීතයේදී භාවිතා වූ ඇතැම් යෙදුම්, වර්තමානයට ද එසේම උචිත වන්නේ දැයි, Ethics Eye අපි මින් පෙරද අසා ඇත්තෙමු. නිදසුන් ලෙසට, අතීතයේ යම් යම් වෘත්තීන් සම්බන්ධයෙන් පසුගාමී ආකල්පයන් සහිතව භාවිතා වූ යෙදුම්, වර්තමානය වන විට වෙනස් කිරීමට කාලය පැමිණ නොමැතිදැයි අප ඇසිය යුතු වේ. "හාම්පුතා" සහ "මෙහෙකරුවා"/"මෙහෙකාරිය" වැනි යෙදුම් ද එයට ඇතුළත් වේ.
ටෙලිනාට්‍ය නිෂ්පාදිකාවකගේ නිවසේ සිදුවූ සොරකමක් සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගැනුණු, නිවසේ ගෘහසේවිකාව ලෙසින් සේවය කළ කාන්තාවක්, පොලිස් අත්අඩංගුවේ පසුවන අතරතුර මියයෑමේ පුවත මාධ්‍ය වාර්තා කර තිබිණි. ඒ සම්බන්ධයෙන්, දිනමිණ, දිවයින සහ අරුණ පුවත්පත් (මැයි 15, 2023) වාර්තාවන් හි සඳහන්ව තිබූ ආකාරය මෙසේය.
* දිනමිණ, දිවයින - "මෙහෙකාරිය"
* අරුණ - "ගෘහ සේවිකාව"
ඔබ සිතනා ලෙසට
1) වර්තමානයේ පවතින සේවානියුක්ත-සේවායෝජක වැනි වඩාත් වෘත්තිමය සම්බන්ධතාවයන් තුළ "මෙහෙකාරිය" යන යෙදුම කෙතරම් උචිත ද? ඒ ඔස්සේ වඩාත් පසුගාමී සමාජ සම්බන්ධතාවයක් නොපෙන්වන්නේ ද?
2) ඒ වෙනුවට, අරුණ පුවතෙහි දක්වා ඇති පරිදි, "ගෘහ සේවිකාව" යන යෙදුම වඩාත් උචිත නොවන්නේ ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

